Lesson 15

# She doesn't like it

ඇය ඒකට කැමති නැහැ

සාමාන්‍ය ක්‍රියා වල නැත අර්ථය

අපි කලින් පාඩමේදී ඉගෙන ගත්තා සාමාන්‍යයෙන් අපි කරන ක්‍රියාවන් ප්‍රකාශ කරන විදිය . එහිදී යෙදෙන්නේ සාමාන්‍ය ක්‍රියා පදය .ඒ වගේම ක්‍රියාව කරන කෙනා එක්කෙනෙක් නම් ක්‍රියාපදය අගට s අකුරක් එකතු වුනා . නැවත ඒ පාඩම් මතක් කරගන්නත් එක්ක උදාහරණ කීපයක් ගෙන බලමු

I watch cartoons
අයි වොච් කාටුන්ස්
මම කාටුන්ස් බලනවා

My father buys the newspaper everyday
මයි ෆාද(ර්) බයිස් ද නිව්ස්පේප(ර්) එව්රිඩේ
මගේ තාත්තා හැමදාම පත්තරේ ගන්නවා

We play cricket in the evening
වී ප්ලේ ක්‍රිකට් ඉන් ද ඊව්නිං
අපි හවසට ක්‍රිකට් සෙල්ලම් කරනවා

She sings well
ෂී සිංග්ස් වෙල්
ඇය හොදට ගායනා කරනවා

Dogs bark at night
ඩෝග්ස් බා(ර් )ක් ඇට් නයිට්
රෑට බල්ලෝ බුරනවා

My sister reads a lot
මයි සිස්ට(ර්|) රීඩ්ස් අ ලොට්
මගේ සහෝදරිය ගොඩක් කියවනවා

අපි දැන් ඉගෙන ගන්න යන්නේ මෙහි නැත අර්ථය, ඒ කියන්නේ සාමාන්‍ය ක්‍රියාවක් “කරන්නේ නැ “ කියල කියන විදිය . මෙහිදී ක්‍රියාව කරන කෙනා ඒක වචනද බහු වචනද යන කරුණ මත වෙනස් විදි දෙකක් යෙදෙන්නේ

- ක්‍රියාව කරන කෙනා එක්කෙනෙක් නම් ක්‍රියා පදය ඉදිරියට does not යන පදය එකතු වෙනවා. ඒ වගේම ,ඒ ආකාරයට does not එකතු වුනාම වාක්‍යයේ ක්‍රියා පදය අගට යෙදුනු s අකුර ඉවත් වෙනවා

අපි ඉහත උදාහරණ වාක්‍යය වලින් ඒක වචන කතෘ ඉන්න වාක්‍ය 3ක් අරගෙන බලමු කොහොමද ඒක වෙන්නේ කියලා

My father buys the newspaper → My father does not buy the newspaper

මයි ෆාද(ර්) බයිස් ද නිව්ස්පේප(ර්) → මයි ෆාද(ර්) ඩස්නොට් බයි ද නිව්ස්පේප(ර්)

මගේ තාත්තා  පත්තරේ ගන්නවා → මගේ තාත්තා  පත්තරේ ගන්නේ නෑ

මෙහි කතෘ සහ ක්‍රියාව තමයි My father buys කියන එක . දැන් මෙය ඒක  වචන කතෘ කෙනෙක් කරන  ක්‍රියාවක් නිසා ,ක්‍රියා පදයට පෙර does  not  එකතු වෙනවා

My father does not buy(s)

ඊළගට අර ක්‍රියා පදය අගට තිබෙන s අකුරත් ඉවත් වෙනවා

My father does  not buy

දැන් සම්පූර්ණ වාක්‍යයම ගමු

My father does not buy the newspaper everyday

ඒ අකාරයටම පහත උදාහරණ වලත් නැතාර්ථය  එකතු වෙද්දී ඒ සිදුවන වෙනස තේරුම් ගන්න උත්සාහ කරන්න

She sings well → She does not sing well
ෂී  සිංග්ස් වෙල් → ෂී  ඩස්නොට් සිං  වෙල්
ඇය  හොදට ගායනා කරනවා → ඇය  හොදට ගායනා කරන්නේ නෑ

My sister reads a lot → My sister does not read a lot
මයි සිස්ට(ර්) රීඩ්ස්  අ ලොට් → මයි සිස්ට(ර්) ඩස්නොට් රීඩ්  අ ලොට්
මගේ සොහොයුරිය ගොඩක් කියවනවා → මගේ සොහොයුරිය ගොඩක් කියවන්නේ නෑ

Does not යන්න  කෙටි කර doesn’t ලෙස භාවිතා කරනවා . බොහෝවිට කතාවේදී එහෙමයි යෙදෙන්නේ . ඒ අනුව ඉහත වාක්‍ය මේ විදියට කිව්වත් හරි

My father doesn’t buy the newspaper
මයි ෆාද(ර්) ඩස්න්ට් බයි ද නිව්ස්පේප(ර්)
මගේ තාත්තා  පත්තරේ ගන්නේ නෑ

She doesn’t sing well
ෂී ඩස්න්ට් සිං වෙල්
ඇය හොදට ගායනා කරන්නේ නෑ

My sister doesn’t read a lot
මයි සිස්ට(ර්) ඩස්න්ට් රීඩ් අ ලොට්
මගේ සොහොයුරිය ගොඩක් කියවන්නේ නෑ

ඊළගට බලමු බහු වචන කතෘ කෙනෙක් ඉන්න සාමාන්‍ය ක්‍රියාවක් නැතාර්ථයට හැරෙන්නේ කොහොමද කියලා

- ❖ ක්‍රියාව කරන කෙනා බහු වචන නම් ක්‍රියා පදයට පෙර එකතු වෙන්නේ do not කියන පදය
  (බහු වචන කතෘ කෙනෙක් සමග කොහොමත් s අකුරක් යෙදෙන්නේ නැති නිසා, s අකුරක් ඉවත් කිරීම ගැන මෙතන වද වෙන්න අවශ්‍ය නෑ )

අපි මේ උදාහරණ තුන අරගෙන බලමු කොහොමද ඒක වෙන්නේ කියලා

I watch cartoons → I do not watch cartoons
අයි වොච් කාටුන්ස් → අයි ඩූ නොට් වොච් කාටුන්ස්
මම කාටුන්ස් බලනවා → මම කාටුන්ස් බලන්නේ නෑ

We play cricket in the evening → We do not play cricket in the evening
වී ප්ලේ ක්‍රිකට් ඉන් ද ඊව්නිං → වී ඩූ නොට් ප්ලේ ක්‍රිකට් ඉන් ද ඊව්නිං
අපි හවසට ක්‍රිකට් සෙල්ලම් කරනවා → අපි හවසට ක්‍රිකට් සෙල්ලම් කරන්නේ නෑ

Dogs bark at night → Dogs do not bark at night
ඩෝග්ස් බා(ර් )ක් ඈට් නයිට් → ඩෝග්ස් ඩූ නොට් බා(ර්)ක් ඈට් නයිට්
රෑට බල්ලෝ බුරනවා → බල්ලෝ රෑට බුරන්නේ නෑ

Do not යන්න කෙටිකර don ‘t (ඩෝන්ට් ) යනුවෙන් භාවිතා වෙනවා . බොහෝවිට කතා බහේදී භාවිතා වෙන්නේ එහෙම . ඒ අනුව ඉහත උදාහරණ මෙහෙම කියවෙන්න පුළුවන්

I don’t watch cartoons
අයි ඩෝන් ට් වොච් කාටුන්ස්
මම කාටූන් බලන්නේ නෑ

We don’t play cricket in the evening
වී ඩෝන්ට් ප්ලේ ක්‍රිකට් ඉන් දි ඊවිනින්
අපි හවසට ක්‍රිකට් සෙල්ලම් කරන්නේ නෑ

Dogs don’t bark at night
ඩෝග්ස් ඩෝන්ට් බාක් ඇට් නයිට්
බල්ලෝ රෑට බුරන්නේ නෑ

මීලගට අපි සාමාන්‍ය ක්‍රියා පාඩමේ ආපු උදාහරණ කීපයක්ම ගෙන ඒවා නැත අර්ථයට හරවමු. මෙතැනදී සැලකිළිමත් වෙන්න ඕන ඒවායේ කතෘ ඒක වචනද ,බහු වචනද කියන කාරණය ගැන

| | | |
|---|---|---|
| I like cartoons | → | I do not (don’t ) like cartoons |
| අයි ලයික් කාටුන්ස් | | අයි ඩූ නොට් (ඩෝන්ට් )ලයික් කාටුන්ස් |
| මම කාටුන්ස් වලට කැමතියි | | මම කාටුන්ස් වලට කැමති නෑ |
| You do it well | → | You do not(don’t ) do it well |
| යූ ඩූ ඉට් වෙල් | | යූ ඩූ නොට් (ඩෝන්ට් )ඩූ ඉත වෙල් |
| ඔයා ඒක හොදට කරනවා | | ඔයා ඒක හොදට කරන්නේ නෑ |
| We water the plants | → | We do not (don’t ) water the plants |
| වී වෝට(ර්) ද ප්ලාන්ට්ස් | | වී ඩූ නොට් (ඩෝන්ට්) වෝට(ර්) ද ප්ලාන්ට්ස් |
| අපි පැල වලට වතුර දානවා | | අපි පැල වලට වතුර දාන්නේ නෑ |
| Shanika writes poems | → | Shanika does not(doesn’t) write poems |
| ෂී රයිට්ස් පොයම්ස් | | ෂි ඩස් නොට් (ඩස්න්ට්) රයිට් පොයම්ස් |
| ඇය කවි ලියනවා | | ඇය කවි ලියන්නේ නෑ |
| She speaks English fluently | → | She does not (doesn’t) speak English fluently |
| ෂී ස්පීක්ස් ඉංග්ලිෂ් ෆ්ලුවන්ට්ලී | | ෂි ඩස් නොට් ස්පීක් ඉංග්ලිෂ් ෆ්ලුවන්ට්ලි |
| ඇය චතුර ලෙස ඉංග්‍රීසි කතාකරනවා | | ඇය චතුර ලෙස ඉංග්‍රීසි කතා කරන්නේ |

He knows me well → He does not (doesn't )know me well

හී නෝව්ස් මී වෙල්

ඔහු මාව හොදට දන්නවා

හී ඩස් නොට් ( ඩස්න්ට්) නෝ මී වෙල්

ඔහු මාව හොදට දන්නේ නෑ

සාමාන්‍ය ක්‍රියා වල නැතර්තය යෙදෙන තවත් හොද වාක්‍යය කීහිපයක් මේ

She doesn't speak with me

ෂී ඩස්න්ට් ස්පීක් විත් මී

ඇය මා එක්ක කතා කරන් නැහැ

We don't stay up after 10

වී ඩෝන්ට් ස්ටේ අප් ආෆ්ට(ර්) ටෙන්

අපි දහයෙන් පස්සේ ඇහැරිලා ඉන්නේ නැහැ

My father doesn't allow it

මයි ෆාද(ර්) ඩස්න්ට් අලව් ඉට්

මගේ තාත්ත ඒකට ඉඩ දෙන්නේ නැහැ

Buses don't run on time on this route

බසස් ඩෝන්ට් රන් ඔන් ටයිම් ඔන් දිස් රූට්

මේ පාරේ බස් වෙලාවට යන්නේ නැහැ

She doesn't get late for school

ෂී ඩස්න්ට් ගෙට් ලේට් ෆෝ ස්කූල්

ඇය ස්කොලේට පරක්කු වෙන්නේ නැහැ

He doesn't get up early

හී ඩස්න්ට් ගෙට් අප්(ගෙටප් ) අ(ර්ලි

ඔහු වේලාසනින් නැගිටින්නේ නැහැ

My mother doesn't allow it

මයි මද(ර්)) ඩස්න්ට් අලව් ඉට්

මගේ අම්ම එකට ඉඩ දෙන්නේ නැහැ

I don't hear you

අයි ඩෝන්ට් හියර(ර්) යූ

මට ඔයාව ඇහෙන්නේ නැහැ

I don't remember

අයි ඩෝන්ට් රිමෙම්බ(ර්)

මට මතක නැහැ

They don't work quickly

දේ ඩෝන්ට් ව(ර්)ක් ක්වික්ලි

ඔවුන් ඉක්මනින් වැඩ කරන්නේ නැහැ

This machine doesn't work properly

දිස් මැෂින් ඩස්න්ට් ව(ර්)ක් ප්‍රොප(ර්)ලි

මේ මැෂින් එක හරියට වැඩ කරන්නේ නැහැ

She doesn't like it

ෂී ඩස්න්ට් ලයික් ඉට්

ඇය ඒ්ට කැමති නැහැ

Father doesn't give his permission

ෆාද(ර්) ඩස්න්ට් ගිව් හිස් ප(ර්)මිෂන්

තාත්තා ඔහුගේ අවසරය දෙන්නේ නැහැ

I don't know about it

අයි ඩෝන්ට් නෝ අබවුට් ඉට්

මම ඒ ගැන දන්නේ නැහැ

I don’t sit for the exam this time
අයි ඩෝන්ට් සිට් ෆෝ දි එග්සෑම්
මම මේ ගමන විභාගෙට වාඩි වෙන්නේ නැහැ

I don’t think so
අයි ඩෝන්ට් තිංක් සෝ
මම එහෙම හිතන්නේ නැහැ

I don’t go out nowadays
අයි ඩෝන්ට් ගෝ අවුට් නව්අඩේස්
මම මේ දවස් වල එලියට යන්නේ නැහැ

We don’t know him very well
වී ඩෝන්ට් නෝ හිම් වෙරි වෙල්
අපි ඔහුව හොදට දන්නේ නැහැ

හොදයි , දැන් ඔබට පුළුවන් අපි සාමාන්‍යයෙන් කරන ක්‍රියා ඇතුලත් පසුගිය පාඩමේ වාක්‍යය කීපයක් ගෙන ඒවා නතර්ථයට පෙරලන්න . ඒ වගේම සාමාන්‍ය ක්‍රියා වල නැතාර්ථයේ වාක්‍යය කිහිපයක් ඔබම තනන්න උත්සාහ කරන්න. එය හොද අභ්‍යාසයක් මේ කරුණු හොදින් මනසේ තහවුරු වීමට

Lesson 15 **Spoken English**

මීලගට Spoken English පාඩමෙන් අපි බලමු සමාව ඉල්ලන්නේ කොහොමද කියල . මෙයත් පුද්ගලයෙකුගේ වැදගත් කම , සීලාචාර ආකල්පය පෙන්වන, හගවන ලකුණක් . අපි මුලින්ම බලමු ඉංග්‍රීසියෙන් සමාව ඉල්ලන්න භාවිතා වෙන වැකි මොනවද කියලා

I am sorry - අයෑම් සොරි - මට කණගාටුයි / මට සමාවෙන්න

I am so sorry - අයෑම් සෝ සොරි - මට බෙහෙවින්ම කණගාටුයි / මම ගොඩක් සමාව ඉල්ලනවා

I am very sorry - අයෑම් වෙරි සොරි. - මට බෙහෙවින්ම කණගාටුයි/ මම ගොඩක් සමාව ඉල්ලනවා

I am really sorry - අයම් රියලි සොරි - මට ඇත්තටම කණගාටුයි/ මම ඇත්තටම සමාව ඉල්ලනවා

I am extremely sorry - අයෑම් එක්ස්ට්‍රීම්ලි සොරි. - මට අතිශයින්ම කණගාටුයි/ මම බෙහෙවින්ම සමාව ඉල්ලනවා

අපි බලමු උදාහරණ

I’m sorry, I stepped on your foot
අයෑම් සොරි, අයි ස්ටෙප්ඩ් ඔන් යුවර්) ෆුට්
මට සමාවෙන්න , මම ඔයාගේ කකුල පෑගුවා

I am sorry, I dropped your pencil.
අයෑම් සොරි , අයි ඩ්‍රොප්ඩ් යුවර්) පෙන්සිල්
මට සමාවෙන්න , මම ඔයාගේ පැන්සල වැට්ටුවා

I’m so sorry, I didn’t see you there.
අයෑම් සෝ සොරි, අයි ඩිඩන්ට් සී යූ දෙයා
මට බෙහෙවින්ම සමාවෙන්න, මට ඔයා එතන ඉන්නවා දැක්කේ නෑ

I’m very sorry, I forgot to bring your book back.
අයෑම් වෙරි සොරි, අයි ෆොගොට් ටු බ්‍රිං යුවර්) බුක් බැක්
මම ගොඩක් සමාවෙන්න , මට ඔයාගේ පොත ආපහු ගේන්න බැරි වුනා

I am really sorry, I took your pen by mistake.
අයෑම් රියලි සොරි, අයි ටුක් යුවර්) පෙන් බයි මිස්ටේක්
මට ඇත්තටම කනගාටුයි, මම වැරදිලා ඔයාගේ පෑන ගත්තා

I am extremely sorry . It was a mistake
අයෑම් එක්ස්ට්‍රීම්ලි සොරි . ඉට් වෝස් අ මිස්ටේක්
මට අතිශයින්ම කනගාටුයි/ මම බෙහෙවින්ම සමාව ඉල්ලනවා . ඒක අත් වැරද්දක්

I'm sorry, I spilled some water by mistake.
අයිම් සොරි, අයි ස්පිල්ඩ් සම් වෝටර්) බයි මිස්ටේක්.
මට සමාවෙන්න, මගෙන් වැරදීමකින් වතුර ටිකක් ඉහිරුණා.

ඊළගට මේ විදිය ගැන බලමු

Sorry for ……… - සොරි ෆෝ ………. - (……… ගැන) කනගාටුයි / සමාවෙන්න

I am really sorry for my mistake
අයැම් සොරි ෆෝ මයි මිස්ටේක්
මට ඇත්තටම් කනගාටුයි මගෙන් වෙච්චි වැරැද්දට

I am really sorry for what happened
අයැම් රියලි සොරි ෆෝ වට් හැපන්ඩ්
මට ඇත්තටම කනගාටුයි වෙච්චි දේට / මට ඇත්තටම සමා වෙන්න වෙච්චි දේට

I'm really sorry for breaking your toy
අයැම් සොරි ෆෝ බ්‍රේකින් යුව(ර්) ටෝයි
මට ඇත්තටම් සමාවෙන්න ඔයාගේ සෙල්ලම් බඩුව කැඩුවට

I'm sorry for losing your eraser.
අයැම් සොරි ෆෝ ලූසිං යුව(ර්) ඉරේස(ර්)
ඔයාගේ මකනේ නැති කලාට මට සමාවෙන්න

Sorry for taking your seat.
සොරි ෆෝ ටේකිං යුව(ර්) සීට්
ඔයාගේ සීට් එක ගත්තට මට සමාවෙන්න

Sorry for taking too much time
සොරි ෆෝ ටේකිං ටූ මච් ටයිම්

ගොඩාක් වෙලාව ගත්තට සමාවෙන්න

I am sorry for troubling you

අයැම් සොරි ෆෝ ට්‍රබලිං යූ

ඔයාට කරදර කලාට සමාවෙන්න

යාළුවො ,මිත්‍රයෝ , පව්ලේ අය අතර වගේ නම මේ වගේ කෙටියෙන් කියල දාන්නත් පුළුවන්

Sorry, I was late.

සොරි, අයි වෝස් ලේට්

සමාවෙන්න, මම පරක්කු වුනා

Sorry, I forgot it

සොරි , අයි ෆොගොට් ඉට්

සමාවෙන්න, මට ඒක අමතක වුනා

Sorry, I spilled the water.

සොරි, අයි ස්පිල්ඩ් ද වෝට(ර්)

සමාවෙන්න, මම වතුර ඉහිරුවා

Sorry , I did it by mistake

සොරි , අයි ඩිඩ් ඉට් බයි මිස්ටේක්

සමාවෙන්න , මම වැරදීමකින් ඒක කලේ

සමාව ඉල්ලුවාමත් , නිකං නැහුනා වගේ ඉදලා හරියන්නේ නැහැ ,එයට කාරුණික ප්‍රතිචාරයක් දැක්විය යුතුයි . ඒවා ඉංග්‍රීසි සංස්කෘතියේ තිබෙන විශිෂ්ට ලක්ෂණ . අපි ඊලග පාඩමේදී බලමු ඒ විදියට සමාව ඉල්ලීමකට ප්‍රතිචාර දක්වන්නේ කොහොමද කියලා

**Vocabulary 15**

stay up - ස්ටේ අප් - නොනිදා ඉන්නවා
get late - ගෙට් ලේට් - ප්‍රමාද වෙනවා
fluent - ෆ්ලුවන්ට් - චතුර (භාෂාවක)
fluently - ෆ්ලුවන්ට්ලි - චතුර ලෙස

extremely - එක්ස්ට්‍රීම්ලි - අතිශයින්ම
quick - ක්වික් - ඉක්මන්
quickly - ක්වික්ලි - ඉක්මනින්
route - රූට් - මාර්ගය

step - ස්ටෙප් - පඩිය
step - ස්ටෙප් - අඩිය / අඩිය තබනවා
door step - ඩෝ ස්ටෙප් - දොරකඩ
drop - ඩ්‍රොප් - වට්ටනවා, බිම දමනවා

forget - ෆොගෙට් - අමතක කරනවා
forgot - ෆොගොට් - අමතක කළා
spill - ස්පිල් - ඉහිරනවා
toy - ටෝයි - සෙල්ලම් බඩුව

allow - ඇලව් - ඉඩ දෙන්වා
get late - ගෙට් ලේට් - ප්‍රමාද වෙනවා
get up - ගෙට් අප් (ගෙටප්) - ඇහැරෙනවා
nowadays - නව්අඩේස් - මේ දවස්වල

hear - හිය(ර්) - ඇසෙනවා
remember - රිමේම්බ(ර්) - මතක තබාගන්නවා/ මතක තියෙනවා
permission - ප(ර්)මිෂන් - අවසරය
foot - ෆුට් - පය

mistake - මිස්ටේක් - දෝෂය / වැරැද්ද
by mistake - බයි මිස්ටේක් - වැරදීමෙන්
extremely - එක්ස්ට්‍රීම්ලි - අතිශයින්ම
break - බ්‍රේක් - බිඳිනවා

lose - ලූස් - නැති වෙනවා /නැති කරගන්නවා
eraser - ඉරේස(ර්) - මකනය
spill - ස්පිල් - ඉහිරනවා